// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1673/47 - 2010 ඔක්තෝබර් 01 වැනි සිකුරාදා - 2010.10.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 13/78.

### ලේකම්වරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

ජනාධිපතිවරයා විසින් නියම කරන ලද පරිදි 1979 අගෝස්තු 6 වැනි දින අංක 48/2 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ සහ කලින් කළ සංශෝධිත ලේකම්වරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය, පහත උපලේඛනයෙහි සඳහන් ලෙසින් සංශෝධනය කිරීමට අතිගරු ජනාධිපතිතුමා නියම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

2010 සැප්තැම්බර් මස 29 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) ලේකම්වරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයෙහි 10 වැනි ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරනු ලැබේ :–

"10. සෑම ලේකම්වරයකුම, රජයේ සියලු මුදල් හා පරිපාලන නියෝග හා සෙසු රෙගුලාසිවලින් බැඳෙන්නේය :

එසේ වූවද, එකී නියෝගවල විධිවිධානයන්හි සහ ලේකම්වරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයෙහි විධිවිධානයන්හි ගැටුමක් තිබෙන අවස්ථාවක ව්‍යවස්ථා සංග්‍රහයෙහි විධිවිධාන බලපැවැත්විය යුතුය."

(2) ලේකම්වරුන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයෙහි 11 වැනි ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(11). මේ සංග්‍රහයෙහි මතු දැක්වෙන විධිවිධාන, ජනාධිපති ලේකම්, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් සහ ජනාධිපති කාර්යාලයේ කාර්ය මණ්ඩල ප්‍රධානී සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය." ;

10 - 642

1A - G 13507— 430 (2010/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.